
## 1.4. දෙවි සමිඳාණන්වහන්සේ මම වෙමි.

දෙවි සමිඳාණන් වහන්සේ ඉතිහාසය තුළ විවිධාකාරයෙන් අනාවරණය වූ සේක. තමන් වහන්සේ සමඟ ජීවමාන සම්බන්ධයක් ඇති කර ගැනීමට මනුෂ්‍යයාට ආරාධනා කරන සේක.

දේව අනාවරණය සැමවිට ම සිදුවන්නේ දේව ස්වරූපයට හා දේව සමානකමට මවා ඇති මිනිසා සම්බන්ධව යි. ආදි පියවරුන්, වීරවරුන්, දිවැසිවරුන් මගින් තමන් වහන්සේ ව ක්‍රම ක්‍රමයෙන් ජනතාවට අනාවරණය කළ සේක.

තමා සැබෑ වූ එක ම ජීවමාන දෙවියන් වහන්සේ බවත්, සාධාරණ විනිශ්චයකාරයාණන් හා පියාණන් බවත් අනාවරණය කළ සේක.

- **ඔබ මීට පෙර අසා තිබුණත් මෙම සිදුවීම් ගැන ශු. බයිබලය ඇසුරින් සොයා බලන්න.**






නොමිලේ බෙදා හැරීම සඳහා ය.

මෝසෙස්තුමාට තම නාමය හෙළිදරව් කළ දෙවි සමිඳාණෝ, තමන් වහන්සේ ආබ්‍රහම්ගේ ද ඊසාක්ගේ ද ජාකොබ්ගේ ද දෙවියන් වහන්සේ වන බව, එනම්, 'යාවේ' (Yahweh) දෙවියන් බව ප්‍රකාශ කළ සේක.

එය දෙවියන් වහන්සේ හා මිනිසා අතර ගැඹුරු සබඳතාවයකට කරන ආරාධනයකි. ඔවුන්වහන්සේ එළිදරව් වන විට, අප උන්වහන්සේ පිළිගැනීමට සූදානම්වීම, අපේ විශ්වාසය ප්‍රකාශ කිරීමකි. දෙවියන් වහන්සේගේ අනාවරණය ස්ථිර වන්නේ අපේ විශ්වාසය වර්ධනය වීම තුළිනි.

ජීවමාන දෙවියන් වහන්සේ හා මනුෂ්‍යයා අතර පවතින සදාතනික අන්තර් ක්‍රියාවක් වන "දේව අනාවරණය" විවිධ ක්‍රමවලින් ඉතිහාසය තුළ ප්‍රකාශ වී ඇත.

- **ඉහත සඳහන් අනාවරණ ශුද්ධ වූ බයිබලය ඇසුරින් සොයා බලමු.**



## පැරණි ගිවිසුම:

### දැවෙන පඳුරු තුළින්:

එවිට මෝසෙස් දෙවියන් වහන්සේට කතා කොට, "එසේ නම් මා ඊශ්‍රායෙල් සෙනග වෙත ගොස් නුඹලාගේ පියවරුන්ගේ දෙවියන් වහන්සේ මා නුඹලා වෙත එවූ සේක' යි කී විට, ඔවුන් ද, 'ඔවුන් වහන්සේගේ නම කුමක් ද' යි මගෙන් අසන කල 'මම ඔවුන්ට කුමක් කියම්ද' යි ඇසී ය. ඔවුන්වහන්සේ මෝසෙස්ට පිළිතුරු දෙමින්, 'මම වනාහි ස්වයම්භූ නම් තැනැත් වහන්සේ වෙමි' ස්වයම්භූ තැනැත් වහන්සේ ඔබ වෙත මා එවූ සේක' යි නුඹ ඊශ්‍රායෙල් ජනයාට කිව යුතු ය" යි වදාළ සේක. තවදුරටත් ඔවුන් වහන්සේ මෝසෙස්ට කතා කරමින් මෙසේ වදාළ සේක. "ආබ්‍රහම්ගේ දෙවියන් වහන්සේ ද ඊසාක්ගේ දෙවියන් වහන්සේ ද ජාකොබ්ගේ දෙවියන් වහන්සේ ද වන නුඹලාගේ පියවරුන්ගේ දෙවි සමිඳාණන් වහන්සේ ඔබ වෙත මා එවූ සේක' යි කිව යුතු ය; සදහට ම මෙය මාගේ නාමය වේ; මතු සියලු පරම්පරාවෝ මේ නාමයෙන් මට ආමන්ත්‍රණය කරති."

(නික්මයාම 3:1315)

### සිනායි ගිවිසුම තුළින්

"එබැවින් දැන් ඉතින් නුඹලා සැබවින් ම මාගේ හඬට කීකරු වන්නාහු නම්, මාගේ ගිවිසුම පිළිපදින්නාහු නම්, සියලු සෙනග අතරින් නුඹලා මටම අයිති සම්පත වන්නාහු ය. මන්ද මුළු මහ පොළොව මා සතු ය, නුඹලා මට පූජක රාජ්‍යයක් ද කැප වූ ජාතියක් ද වන්නාහු ය"යි වදාළ සේක.

(නික්මයාම 19:56)

## නව ගිවිසුම:

### බව්තීස්ම ස්නාපනය තුළින්

> ජේසුස් වහන්සේත් බව්තිස්ම ස්නාපනය ලබා, යාච්ඤා කරමින් සිටිය දී, ස්වර්ගය විවර වී, ශුද්ධාත්මයාණෝ පරවියකුගේ රූපාකාරයෙන්, උන්වහන්සේ කෙරෙහි පහළ වූ සේක. එවිට: "ඔබ මාගේ ප්‍රියාදර පුත්‍රයාණෝ ය; ඔබ කෙරෙහි ඉතා ප්‍රසන්න වී සිටිමි"යි අහසින් හඬක් නික්මිණි.
>
> (ලූක් 3:2122)

### අනන්‍යරූප විලාශවීම තුළින්

> එවිට "මේ මාගේ පුත්‍රයාණෝය, මේ මා තෝරාගත් තැනැත්තාණෝ ය; මොහුට සවන් දෙන්න"යි වළාකුලෙන් හඬක් නික්මිණි.
>
> (ලූක් 9:35)

දෙවියන් වහන්සේ ඊශ්‍රාරායෙල් ජනතාව තම තෝරා ගත් සෙනග ලෙස පත් කරගෙන, ඔවුන් සමග ගිවිසුමක් ඇතිකර ගැනීම, ඉතිහාසයේ ප්‍රධානතම අනාවරණය ලෙස දක්විය හැකි ය. මෙම ගිවිසුම මගින්, ඔවුන්ට තමන් වහන්සේ සම්පූර්ණයෙන් ම එළිදරව් කළ අතර; ඊශ්‍රාරායෙල් ජනයා ද උන්වහන්සේ පිළිගෙන, මුළු ලෝකය ඉදිරියේ සාක්ෂි දැරීමට ගිවිසුම් දුන්හ. දෙවියන් වහන්සේ මෙම ගිවිසුම් බැඳීම තුළ තමන් වහන්සේගේ සැලසුම ජනතාවට අනාවරණය කරමින් ඔවුන්ගේ යහ පැවැත්මට අදාළ නීති මාලාව සකසා දුන්හ.

දිවැසිවරු ද, දේව අනාවරණ ඉතිහාසයේ, තවත් වැදගත් කාර්යයක් ඉටු කළහ. ඔව්හු දේව වචනය කාලාන්තරයක් තුළ ආරක්ෂා කර ගනිමින්, විවිධ හිංසා හා කරදර මැද, එය වඩා පැහැදිලි ලෙස ජනතාවට කියා දුන්හ; දේව අණ පණත්

ආරක්ෂා කරමින්, ගිවිසුම් ජීවිතය ගෙන යාමට මඟ පෙන්වූහ; දේව වචනයේ බලය තුළින්, මරණයෙන් ගැලවීම, හමුදා පලවා හැරීම ආදී ප්‍රබල ක්‍රියා ද ඉටු කරමින් ගැලවීමේ සැලැස්ම එළිදරව් කළහ.

මේ අනුව පැරණි ගිවිසුම තුළ දී, දෙවියන් වහන්සේ තම අනන්‍යතාවය, සුහද ව හඳුන්වා දෙමින්, අප ව හඳුනාගැනීමට ඇති කැමැත්ත ප්‍රකාශ කරන සේක. ඒ මඟින් අප දේව දරුවන් මෙන්, තමන්වහන්සේට ම අයිති කර ගන්නට හා සම්පතක් කර ගන්නට බලා සිටින අයුරු හඳුනා ගනිමු.

නව ගිවිසුම තුළ දේව අනාවරණය ක්‍රිස්තුන් වහන්සේ කේන්ද්‍ර කරගෙන, සිදු වී ඇත. එමඟින් ඔවුන් වහන්සේගේ පරිපූර්ණ ප්‍රතිරූපය ඉදිරිපත් කරන්නේ මෙසේ ය.

"මා දුටු තැනැත්තේ, පියාණන් වහන්සේ දුටුවේ ය." (ජොහාන් 14:9)

"මම යහපත් බැටළු එඬේරා වෙමි;" (ජොහාන් 10:14)

"මාර්ගය ද සත්‍යය ද ජීවනය ද මම වෙමි." (ජොහාන් 14:6)

ගැලවීමේ ඉතිහාසය හා ක්‍රිස්තුන් වහන්සේ තුළින්, තමන්වහන්සේ ව ප්‍රකාශ කරමින්, මිනිස් අපගේ විශ්වාසය පිළිබඳ සත්‍යතාවන්, තහවුරු කරන සේක.

ක්‍රමානුකූලව සිදු වන දේව අනාවරණය මගින් හා ක්‍රිස්තුන් වහන්සේ තුළින් ඔවුන්වහන්සේ හඳුනා ගැනීම, එමගින් දෙවිඳුන් හමු වීම, දේව ස්වරූපය බෙදා ගැනීම ආදිය මගින් ගැඹුරු දේව සබඳතාවකට අපට ආරාධනා කරන බවත් තේරුම් ගනිමු.

## අපේ ප්‍රතිචාරය

- අපට ප්‍රකාශ වන දෙවියන් වහන්සේට ශ්‍රද්ධාවෙන් යුතු ව පිළිතුරු දෙමු.
- ඔවුන් වහන්සේට අපේ බුද්ධිය හා නිදහස් කැමැත්ත පවරා දෙමින් දේව කැමැත්තට අවනත වෙමු.
- සම්පූර්ණ කැමැත්තෙන් දෙවිඳුන්ට සවන් දෙමු.


නොමිලේ බෙදා හැරීම සඳහා ය.

❒ දේව වචනය අසා ඒ ගැන විශ්වාසයෙන් හා කැපවීමෙන් යුතු ව කටයුතු කරමු.

❒ දේව අනාවරණයට අවනත ව, විශ්වාසයෙන් පිළිතුරු දෙමින්, ගැලවීමේ මාර්ගය උදාකර ගනිමු.

❒ වගකීමෙන් හා කැපවීමෙන් අපේ කාර්යයන් ඉටු කරමින් ක්‍රිස්තුවරයාණන් ආදර්ශනය කරමු.

**දේව අනාවරණයේ සුළ මුල ප්‍රේමයයි.**

**මෙම දේව ප්‍රේමය තුළ**
**විශ්වාසයේ ජීවිතය**
**ශක්තිමත් ව ගොඩනගා ගැනීමට**
**ක්‍රියා කරමු.**

**මෙය ඔබට කළ හැකි ද?**

● දේව අනාවරණය සිදු වූ ආකාරය පිළිබඳ ව පහත සඳහන් මාතෘකා යටතේ කරුණු ගොනු කරන්න.

1. තෝරාගත් ජනතාවගේ ජීවිත අත්දැකීම් තුළින් දෙවිඳුන් අනාවරණය වීම.
2. දිවැසිවරුන් මගින් දේව අනාවරණය සිදු වූ අවස්ථා.
3. ශුද්ධ වූ ත්‍රිත්වය අනාවරණය වූ අවස්ථා.

**ඔබේ ජීවිතයට..**

❒ ඔබ වෙත දෙවිඳුන් අනාවරණය කරන පණිවිඩය තේරුම් ගන්නට උත්සාහ ගන්න.

❒ ඔබගේ ජීවිතය තුළින් ක්‍රිස්තුන් වහන්සේ අනාවරණය කිරීමට උත්සාහ කරන්න.


නොමිලේ බෙදා හැරීම සඳහා ය.

**"දේව අනාවරණය හා විශ්වාසය එකිනෙකින් වෙන් කළ නො හැකිය."**

**මෙනෙහි කිරීම සඳහා**

"දෙවියන් වහන්සේ ආදි යුගවල දී, නොයෙක් විට ද විවිධාකාරයෙන් ද දිවැසිවරයන් මගින් අපේ පියවරුන්ට කතා කළ සේක. එහෙත් දැන් මේ අවසාන කාලයේ දී ඔවුන්වහන්සේ සිය පුත්‍රයාණන් මගින් අපට කතා කළ සේක. ඔවුන්වහන්සේ කරණකොටගෙන දෙවියන් වහන්සේ මුළු විශ්වය මවා, සියල්ලේ උරුමකාරයාණන් කොට ඔවුන්වහන්සේ පත් කළ සේක."

(හෙබ්‍රෙව් 1:12)